# ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය
## ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය
## පුරප්පාඩු

**1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත මගින් ස්ථාපිත කර ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් වන අතර, සෑම සුක්කානමක් පසුපසම නීරෝගී රියදුරෙකු බිහි කිරීම අපගේ දැක්ම වේ.**
**ප්‍රවාහන වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වශයෙන්, අප ආයතනය ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීමට වෘත්තිකයන්ගේ දායකත්වය අවශ්‍ය බැවින් පහත පුරප්පාඩු තනතුර සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීමට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

### දෘඩාංග කාර්මික

### දෘඩාංග කාර්මික – MA 2.1 – පුරප්පාඩු සංඛ්‍යාව – 01

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා(NVQ)පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක පරිගණක දෘඩාංග ක්ෂේත්‍රයේ කාර්මික ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

- **වයස:-** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය**

| | |
|---|---|
| වැටුප් පරිමාණය<br><br>කළමණාකරණ සේවා චක්‍රලේඛ 01/2025 II උපලේඛනය අනුව වැටුප් ගෙවීම හා තනතුරට අදාළ අනෙකුත් දීමනා හිමි වේ. | MA 2.1<br><br>රු. 50,540 – 10×540 – 7×630 – 4×890 – 20×1,190 87,710 |

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 දරණ චක්‍රලේඛයට අනුව මෙම වැටුප අදාළ වන්නේ 2027.01.01 දින සිටය. 2025.04.01 දිනට ගෙවන වැටුප රු.43,379 ක් වේ.)

**ඉහත තනතුරු සඳහා අවශ්‍ය පොදු සුදුසුකම්:-**

සෑම අයදුම්කරුවකුම,

i ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
iii විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

සුදුස්සන් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය සතු වේ.

**සියළුම ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් සකස් කර අදාළ සහතිකවල සහතික කළ පිටපත්ද සමග ඥාති නොවන දෙදෙනෙකුගේ නම, ලිපිනය, දුරකථන අංකය සහිතව පහත ලිපිනයට 2025.11.16 දින හෝ ඊට ප්‍රථම, "දෘඩාංග කාර්මික" ලෙස ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කර ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.**

**සභාපති,**
**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,**
**අංක 170, හයිලෙවල් පාර,**
**නුගේගොඩ.**
**දුරකථන :- 011 2852868**